# නැගෙනහිර රෝහණ දේශයේ සෙල්ලක්කා ඔය ගංගා නිම්නයෙන් හමුවන කුඩා පරිමාණයේ ග්‍රාමීය ස්තූප පිළිබඳ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

මහින්ද බණ්ඩාර

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ සමාජීය හා සංස්කෘතික හර පද්ධතියේ ආරම්භය ක්‍රි. පූ 3වන සියවසේ බුදුදහම මෙරටට ආගමනයත් සමගින් සිදුවිය. බුදුදහම මෙරටට හිමිවන විට අගනගරය බවට පත්ව තිබුනේ අනුරාධපුරය වුවද මෙයට සමගාමීව රෝහණයේ ද බුදුදහම ව්‍යාප්ත විය. මිහිඳු මහරහතන් වහන්සේ සමඟ මෙරටට පැමිණි ඉට්ඨිය හිමියන්ගේ භෂ්මයන් තැන්පත්කර දිගාමඩුල්ලෙහි දීඝවාපී ප්‍රදේශයේ ස්තූපයක් තැනූ බව ශිලා ලේඛන සාක්ෂි දරයි. දීඝවාපියෙහි ඉහළ ප්‍රදේශයෙහි පිහිටි මොනරාගල දිස්ත්‍රික්කයෙහි බොහෝ ප්‍රදේශයන් කාලයක් වනගහනයට නතුව ජනශූන්‍යව පැවති අතර 1818 ඌව වෙල්ලස්ස කැරැල්ලෙන් පසුව නැවත ජනාවාසකරණයට බඳුන් විය. මෙම ක්ෂේත්‍ර අධ්‍යයනයට පාදක කරගත් සෙල්ලක්කා ඔය ගංගා නිම්නය පිහිටා ඇත්තේ සේනානායක සමුද්‍රයේ ඉහළ ජල පෝෂක ප්‍රදේශයට වන්නටයි.

පැරණි රෝහණ දේශයෙන් හමුවන ස්තූපයන් අධ්‍යයනය කිරීමෙන් පැහැදිළි වන්නේ අනුරාධපුර රාජධානි සමයේ පටන් මෙම ප්‍රදේශයේ බෞද්ධ ජනපදිකයින් පදිංචි වී සිටි බවයි. ප්‍රධාන වශයෙන් මෙම ප්‍රදේශයේ දැකිය හැකි ස්තූපයන් ප්‍රමාණය අනුව වර්ග කිහිපයකි.

- මහා පරිමාණයේ ස්තූප
- මධ්‍ය පරිමාණයේ ස්තූප
- කුඩා පරිමාණයේ ස්තූප

සෙල්ලක්කා ඔය ගංගා නිම්නය ආශ්‍රිතව හමුවන්නේ ග්‍රාමීය කුඩා පරිමාණයේ ස්තූපයන් ය. මෙසේ හමුවන කුඩා පරිමාණයේ ස්තූපයන් තුළින් මෙම ප්‍රදේශය ආශ්‍රිතව ග්‍රාමීය බෞද්ධ ජනාවාසයක් පිහිටා තිබෙන්නට ඇතැයි උපකල්පනය කළ හැකිය. මහා පරිමාණයේ ස්තූප පිළිබඳව පුරාවිදුවන්ගේ වැඩි අවධානයක් යොමු වුවද කුඩා පරිමාණයේ ස්තූපයන් නොසලකා බැහැරකළ හැකි නොවේ. සෙල්ලක්කා ඔය ගංගා නිම්නය ආශ්‍රිතව හමුවන කුඩා ස්තූප සමග බැඳි භෞතික හා සංස්කෘතික පරිසරය විමසීමේ දී නිසි පරිදි අනාවරණය කර ගැනීමකට බඳුන් නොවූ මෙම ප්‍රදේශයන් හි පැවති බෞද්ධ ජනාවාස පිළිබඳ

කරුණු අනාවරණය කරගත හැකි වන්නේය. එසේම කුඩා ස්තූප හා බැඳි සංස්කෘතිය, ජනපදයන්හි ව්‍යාප්තිය මෙන්ම ප්‍රදේශයේ ඓතිහාසිකත්වය ද විවරණය කර ගැනීමට මෙම කුඩා ස්තූපයන් උපයුක්ත කරගත හැකිය.

## අධ්‍යයන ගැටලුව

සෙල්ලක්කා ඔය ගංගා නිම්නය ආශ්‍රිතව පවතින කුඩා පරිමාණයේ ග්‍රාමීය ස්තූප පිළිබඳව විමර්ශනය කිරීමේ දී මතු වූ ප්‍රධාන අධ්‍යයන ගැටළුව වූයේ " වනගත ගංගා නිම්නයක් දිගේ එක හා සමාන ප්‍රමාණයේ බෞද්ධ ස්තූප ගණනාවක් ව්‍යාප්ත වූයේ ඇයි යන්නයි. රුහුණ හා රජරට යා කරන මාර්ගයෙහි පිහිටා ඇති මෙම ජල මූලාශ්‍රය ආශ්‍රිතව පවතින පැරණි ජනපදික ප්‍රදේශයේ අතීතයේ පැවති ජනාවාසකරණය හා ස්තූප සංස්කෘතිය අවබෝධකර ගැනීමට උත්සාහ ගැනීමේ දී පහත අධ්‍යයන ප්‍රශ්න මතු විය. සෙල්ලක්කා ඔය ප්‍රදේශයේ පවතින කුඩා ස්තූපයන් කිනම් යුගයක, කවරෙකුගේ මූලිකත්වයෙන් ඉදි වූයේ ද?, මෙම ප්‍රදේශයේ පැවති ජනපද බුදු දහම සමග පැවති සබඳතාවයෙහි ස්වරූපය කවරාකාර ද?, ප්‍රාදේශීය වශයෙන් ආගමික ව්‍යාප්තිය සිදු වූයේ කෙසේ ද? මෙකී ප්‍රශ්නවලට පිළිතුරු සෙවීමේ දී සෙල්ලක්කා ඔය ගංගා නිම්නය ආශ්‍රිත ග්‍රාමීය ස්තූප පිළිබඳව නිවැරදි විවරණයක් කරගත හැකිය.

## අධ්‍යයන අරමුණු හා වැදගත්කම

සෙල්ලක්කා ඔය නිම්නය ආශ්‍රිත කුඩා ස්තූප සංස්කෘතිය පිළිබඳ ගවේෂණයේ ප්‍රධාන අරමුණක් බවට පත් වූයේ අනුරාධපුර රාජධානි සමයෙහි හෝ ඉන් පසුකාලීනව ප්‍රත්‍යන්ත ජනපදවල ග්‍රාමීය ස්තූප කලාව පිළිබඳව අධ්‍යයනය කිරීමයි. එසේම ග්‍රාමීය ස්තූප ඉදිකිරීමේ තාක්ෂණය හා මෙවායෙහි පුරාවිද්‍යාත්මක වැදගත්කම විමසීම ද අවශේෂ අරමුණු විය. තවද ග්‍රාමීය ප්‍රදේශ වල ස්තූප කලාව හා බැඳි පැරණි ජනාවාසකරණය අධ්‍යයනය මෙන්ම කුඩා ස්තූප බිහිවීමේ ඓතිහාසික බලවේග හඳුනා ගැනීම ද මෙහි දී අරමුණු කරගන්නා ලදී. සෙල්ලක්කා ඔය නිම්න කුඩා ස්තූප ප්‍රාදේශීය වශයෙන් වැදගත් අංගයකි. මෙම ප්‍රදේශයේ ප්‍රාදේශීය ඉතිහාසය ගොඩනැගීමේ දී අතීතයේ පැවති ජනාවාස, ආගමික ස්වාභාවය, තාක්ෂණය හා කලාව ආදී කරුණු විවරණය කර ගැනීමට මෙම ස්තූප අතිශයින් වැදගත් වේ. එසේම නූතනයේ සිදුවන මානව ක්‍රියාකාරකම් හේතුවෙන් සීඝ්‍රයෙන් විනාශයට පත්වන පුරාවිද්‍යාත්මක අවශේෂ හඳුනාගැනීම ද කාලීන වශයෙන් වැදගත් කරුණකි.

**අධ්‍යයන ක්‍රමවේදය**

නැගෙනහිර රෝහණ දේශයේ සෙල්ලක්කා ඔය ගංගා නිම්නය පදනම් කරගත් ග්‍රාමීය ස්තූප සංස්කෘතිය පිළිබඳ විමර්ශනයේ දී ක්ෂේත්‍ර අධ්‍යයන ක්‍රමවේදය හා පුස්තකාල ග්‍රන්ථ පරිශීලනය සිදුකරන ලදී. ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී සෙල්ලක්කා ඔය ගංගා නිම්න ප්‍රදේශයට ගොස් කුඩා පරිමාණයේ ස්තූප සහිත පරිශ්‍ර හඳුනාගනු ලැබීය. ඒවා වෙන් වෙන් වශයෙන් ගෙන ඡායාරූප ගත කිරීම, නිදර්ශක රැස්කිරීම, ක්ෂේත්‍රීය සම්පත් ශක්‍යතාවය අධ්‍යයනය මෙන්ම වාර්තාකිරීම සිදුකරනු ලැබීය. එසේම මෙම ක්ෂේත්‍රයට හා ස්තූප පිළිබඳව පවතින ග්‍රන්ථ පරිශීලනය කිරීම මඟින් සපයාගත් දත්තයන් සමග ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත විශ්ලේෂණය කර නිගමන හා යෝජනා ගම්‍ය කරගනු ලැබීය. ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී මූලික අවධානය යොමුකරනු ලැබූ කරුණු කිහිපයකි. එනම් ක්ෂේත්‍රය සකස්වීමේ ක්‍රියාවලිය (site formation process), ක්ෂේත්‍රවල නියැදි අවකාශයේ පරිමිතිය (size of the sample universe), ප්‍රදේශයේ සම්පත් ශක්‍යතාවය (resource potentials), ආංශුක පරිමාණයේ පරිසර සන්දර්භය (micro environmental context), මෑතකාලින මනුෂ්‍ය ක්‍රියාවන් නිසා ක්ෂේත්‍රයට සිදුවී ඇති බලපෑම් තිව්‍රතාවය (impact of the recent site modification)ආදී කරුණු පිළිබඳව ය.

**සෙල්ලක්කා ඔය ගංගා නිම්න ග්‍රාමීය කුඩා ස්තූප කලාව**

සෙල්ලක්කා ඔය නිම්නයෙහි ඉහළ සිට පහළට විහි දී යන ආකාරයෙන් කුඩා ස්තූපයන් හයක් පමණ ක්ෂේත්‍ර අධ්‍යයනයෙන් හඳුනාගත හැකි විය. එම ස්තූප පවතින ස්ථාන නූතන ව්‍යවහාරයට අනුව

- දේවගිරි විහාර ස්තූපය
- රැන ගල ස්තූපය
- වෙහෙරකැටිය ස්තූපය
- කරගහවෙල ස්තූපය
- බෝගහ කිවුල ස්තූපය
- තඹදෙණිය ස්තූපය ලෙසින් හඳුනාගත හැකිය.

සෙල්ලක්කා ඔය ඉහළ ජල පෝෂක ප්‍රදේශයේ දේවගිරි ස්තූපය හමුවන අතර මෙහි හතරැස් කොටුවෙන් පහළ කොටස දැකගත හැකිය. මීටර් 5.5 පමණ උස් වන මෙම ස්තූපයේ ගල් පතුරු අල්ලා කරන ලද එක් පේසාවක් දැකගත හැකිය. මෙම ස්තූපයෙහි අනුරාධපුර යුගයේ මුල් කාලයට අයත් ගඩොල් දැකගත හැකිය. ස්තූපය හාත්පස ප්‍රදේශයේ ආසනගල් කිහිපයක් දැකගත හැකි අතර ගල්

කණු සහිත ස්ථානයන් කිහිපයකි. මෙම ස්තූපය විහාර පරිශ්‍රයේ ඉහළම ස්ථානයෙහි හතරැස් භූමි ප්‍රදේශයක ඉදිකර ඇති අතර ගල් පඩිපෙල ද්විත්වයක් ස්තූපය අසලට ප්‍රවේශ වීම සඳහා නැගෙනහිර හා බටහිර දෙසින් යොදා ඇත. මෙම ස්තූපයට මීටර් 600ක පමණ දුරින් ලග්ගල රැනගල ස්තූපය පිහිටා ඇති අතර මෙය පිහිටි පරිශ්‍රයෙහි ගල් ලෙන් කිහිපයක් ද වේ. පර්වත මස්තකයක ඉදිකර ඇති මෙම ස්තූපයෙහි විශ්කම්භය මීටර් 4ක් පමණ වේ. "බත පුශදෙව" නැමැත්තෙක් මෙහි පවතින කටාරම් කෙටූ එක් ලෙනක් පූජා කළ බව දැක් වෙයි. මෙම ස්තූපයට මීටර්500ක පමණ සෙල්ලක්කා ඔය නිම්නයේ පහළට වන්නට වෙහෙරකැටිය ස්තූපය පිහිටා ඇති අතර නූතනයේ දී හේන් වගාව නිසා මෙම ස්තූපය විනාශ වෙමින් පවතී. මෙම ස්තූපයේ විශ්කම්භයද මීටර්4 පමණ වන අතර දැනට ඉතිරිව ඇති කොටසෙහි උස මීටර් 2.5 ක් පමණ වේ. කරගහවෙල ස්තූපය පිහිටා ඇත්තේ වෙහෙරකැටිය ස්තූපයට මීටර්300ක් පමණ දුරිනි. නිදන් හොරුන් විසින් හාරා දමා ඇති ස්තූප ගොඩැල්ලෙහි උස මීටර් 2 ක් පමණ වේ. මීටර් 6ක් පමණ විශ්කම්භයක් ඇති මෙම ස්තූපයේ යටින්ම ගල් පතුරු යෙදූ පාදමක් වූ බවට සාධක හමු වේ. එසේම මෙම පරිශ්‍රය අවට ගල් පතුරු බහුලව හමු වන්නේය. මෙම ස්තූපයට මීටර්800ක් පමණ පහළින් බෝ ගහ කිවුල ස්තූප ගොඩැල්ල හමුවන අතර මෙය ද නිදන් හොරු විසින් හාරා දමා ඇත. මීටර් 5.5 ක් පමණ විශ්කම්භයකින් යුතු මෙම ගොඩැල්ලෙහි උස මීටර් 1.8 ක් පමණ වේ. සෙල්ලක්කා ඔය නිම්නයේ පහළින්ම හමු වන්නේ තඹදෙණිය ස්තූපයයි. කටාරම් කෙටූ ලෙන් විහාර පරිශ්‍රයක හමුවන මෙම ස්තූපයට ප්‍රවේශ වීම සඳහා යෙදූ ගල් පඩි පෙලකි. ස්තූපය අවට ගල් කණු කොටස් ද දැකගත හැකිය. සේනානායක සමුද්‍රයෙහි ජලය පිරියෑම නිසා මෙයින් පහළ ප්‍රදේශය අධ්‍යයනය කිරීම දුෂ්කර කටයුත්තකි.

**සෙල්ලක්කා ඔය ගංගා නිම්නය ආශ්‍රිත ස්තූපවල විශේෂතා හා වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ**

මෙම ප්‍රදේශයෙන් හමුවන ස්තූප සියල්ලම කේන්ද්‍ර වී ඇත්තේ සෙල්ලක්කා ඔය ජල ධාරාවටයි. එසේම මෙම කුඩා ස්තූප අවට පරිශ්‍රය අධ්‍යයනය කිරීමෙන් ස්තූපයට ආසන්නයෙන් පැරණි කුඩා වැවක් තිබූ බව හඳුනාගත හැකි විය. මේවායෙහි මැටි කැට භාවිතයෙන් ජලය පිටතට ලබාගත් බවට සාක්ෂි ලෙස මැටි නල කොටස් ද හමු විය. අධ්‍යයන ප්‍රදේශයෙන් හමු වූ ස්තූපයන් කුඩා පරිමාණයේ ඒවා වූ අතර සෑම කිසිදු ස්තූපයක් විශ්කම්භය මීටර් 10කට වඩා වැඩිනොවී ය. මෙම ප්‍රදේශයෙන් ස්තූප ආශ්‍රිතව අනුරාධපුර හා පොළොන්නරු යන යුගයන්

ද්විත්වයටම අයත් ගඩොල් හමු විය. ස්තූප ඉදිකිරීමේ දී ගල් පතුරුවලින් පාදමක් සැකසීම ද සුවිශේෂී ලක්ෂණයකි.

## නිගමනය

කුඩා ගංගා නිම්නයක් කේන්ද්‍ර කර ගනිමින් පැවති ග්‍රාමීය ජනපදයක ජීවත් වූ ජනපදිකයින් විසින් මෙම කුඩා ස්තූප ඉදිකරන්නට ඇති බව මූලික වශයෙන් නිගමනය කළ හැකිය. එසේම එකිනෙකට ආසන්නයෙන් ස්තූප සමූහයක් ඉදිකර තිබීමෙන් මෙම ප්‍රදේශයේ අතීතයේ දී පැවති ජනාවාස ව්‍යාප්තිය හා බෞද්ධාගමික ස්වභාවය ද අවබෝධ කරගත හැකිය. 13 වන ශත වර්ෂයේ දී පැවති ද්‍රවිඩ ආක්‍රමණයේ දී මෙම ප්‍රදේශයේ පාලන කටයුතු සිදුකළේ ගොවින්දහෙළ සැඟව සිටි ගොවින්ද මලය නම් සෙනෙවියකු විසිනි. මහාවංශයෙහි දැක්වෙන පරිදි ඔහු බුදුදහම සුරැකීමට ගත් උත්සාහයේ ප්‍රතිඵලයක් නිසාවෙන් මෙම කුඩා ස්තූප සංස්කෘතියක් බිහිවූයේ ද යන්න සොයාබැලිය යුතු වේ. නූතනයේ දී ඇතිවන මානව ක්‍රියාකාරකම් හේතුවෙන් මෙම කුඩා පරිමාණයේ ග්‍රාමීය ස්තූපයන්විනාශවන අන්දමක් ද දැකගත හැකිය. එහෙයින් කඩිනමින් පුරාවිදූවන්ගේ අවධානය යොමු වී මෙම ග්‍රාමීය ස්තූපයන් හා බැඳි බෞද්ධ උරුමය ආරක්ෂා කරගත යුතු වේ.